# කායවච්ඡේද, ප්‍රවේණි විද්‍යා සහ ජෛව වෛද්‍ය තොරතුරු අධ්‍යයනාංශය
# වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

නො : 952, මරදාන පාර, කොළඹ 08, ශ්‍රී ලංකාව

*දුරකතන : +94-11-2629711* *විද්‍යුත් ලිපිනය: head@anat.cmb.a.clk*


හිතවත් මහත්මයා /මහත්මිය

<u>අධ්‍යයන කටයුතු සහ වෛද්‍ය පර්යේෂණ සඳහා වෛද්‍ය පීඨයට මෘත ශරීර පරිත්‍යාග කිරීමේ තොරතුරු පත්‍රිකාව</u>

ඔබගේ ශරීරය මරණින් පසු අධ්‍යයන කටයුතු සහ වෛද්‍ය පර්යේෂණ සඳහා භාරදීමට ඔබ විසින්ගෙන ඇති තීරණය ගැන ස්තුතිවන්ත වෙමු. මෘත ශරීරයක් වෛද්‍ය පීඨය වෙත භාරදීම සඳහා භාරකරුවන්ගේ එකගතාවයද අවශ්‍ය වන අතර භාරකරුවන් විසින් අනුගමනය කළයුතු ක්‍රිය පටිපාටිය පහත දක්වා ඇත.

1. භාරකරුවන් විසින් මෘත ශරීරය භාර දීම පිණිස දිනය සහ වෙලාව වෛද්‍ය පීඨ කායවච්ඡේ ද අධ්‍යයනාංශයට පැමිණ හෝ දුරකතනයෙන් අමතා (0112629711) නියම කරගත යුතුය. ඒ සඳහා **සතියේ දින වල පෙ.ව 8.30 සිට ප.ව. 4.00** දක්වා ඇමතිය හැක.

2. මෘත ශරීර භාරගනු ලබන්නේ **සතියේ දිනවල** (රජයේ නිවාඩු හැර) **පෙ.ව.8.30 සිට ප.ව. 2.00** දක්වා පමණි.

3. පූර්ව දැනුම්දීමක් සහ අවශ්‍ය පූර්ව සැලසුම් කිරීමක් සිදු කර ඇත්නම්, සෙනසුරාදා සහ ඉරිදා දිනවල ද මෘත දේහ භාරගත හැකිය.

4. මෘත ශරීරයක් භාරදීමට පැමිණෙන තැනැත්තා අනිවාර්යයෙන්ම පහත සඳහන් ලිපිලේඛන කාර්යාලයට භාරදිය යුතු අතර එම ලිපිලේඛන කිසිදු හේතුවක් මත නැවත භාර කරුවන් හට ලබා **නොදෙන** බවද කරුණාවෙන් සලකන්න.

   4.1 **මරණ ලියාපදිංචි කිරීමේ ලේඛනයේ මුල් පිටපත හෝ මරණ දැන්වීමේ සහතිකය [41 (1) (අ) වගන්තිය].**

   4.1.1 දේහය කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට භාර දෙන බව එම ලේඛනයේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතුය.

   4.1.2 මෙම සහතිකය නොමැතිව කිසිදු හේතුවක් මත දේහය භාරගනු නොලැබේ.

   4.2 **මෘතදේහයේ නීතයානුකූල භාරකරු තමා බවට, දිවුරුම් ප්‍රකාශයක්** (සාමවිනිසුරුවරයෙකු විසින් සහතික කළ යුතුය)

   4.3 **මෘතදේහය භාරෙදන තැනැත්තාගේ ජාතික හැඳුනුම්පතේ ඡායාපිටපතක්** (සාමවිනිසුරුවරයෙකු විසින් සහතික කළ යුතුය).

   4.4 වයස 18ට අඩු අයෙකුගේ මෘත දේහයක් භාර දෙන්නේ නම් දෙමාපියන්ගේ හෝ භාරකරුවන්ගේ ජාතික හැඳුනුම්පත් වල ඡායාපිටපත් සහ දෙමාපියන්ගේ විවාහ සහතිකයේ ඡායාපිටපතක්ද ඉදිරිපත් කළ යුතුය (සාමවිනිසුරුවරයෙකු විසින් සහතික කළ යුතුය).

   4.5 මෑතකදී සිදු වූ මරණයකින් (මරණයෙන් පැය 12ක් ඇතුළත) පසු මෘත දේහයක් පරිත්‍යාග කිරීමේදී, මියගිය පුද්ගලයාගේ පෙර වෛද්‍ය ඉතිහාසයට අදාළ වාර්තා සහ සියලුම අදාළ වෛද්‍ය ලේඛන, වාර්තා සහ පරීක්ෂණ ප්‍රතිඵල **අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය.**

5. දේහය වෛද්‍ය පීඨයට රැගෙන ඒමට පෙර ඉහත ලිපි ලේඛන නිවැරදිදැයි තහවුරු කර ගැනීම සඳහා අදාල ලිපි ලේඛන වල මුල් පිටපත් රැගෙන කායවච්ඡේ ද අධ්‍යයනාංශයේ කාර්යාලයට පැමිණිය යුතුය.

6. මරණය සිදුවී පැය හතලිස් අටක් (48) ඇතුළත දේහය භාරදිය යුතු අතර පැය අටක් (8) ඇතුළත දේහය භාර දෙනු ලබන්නේ නම් ස්වරක්ෂණ (එම්බා ම් ) කිරීම අවශ්‍ය නැත. ස්වරක්ෂණය කරන්නේ නම් එය කළ යුත්තේ ශරීරයේ කිසිම අවයවයක් කපා ඉවත්නොකර කලව පෙදෙසහි ඉහළ කො ටසේ ඉදිරියෙන් පිහිටි ඌර්ව ධමනිය තුළින් ස්වරක්ෂ තරලය විදීමෙන් පමණි. දේහය අධ්‍යයන කටයුතු සඳහා පරිත්‍යාග කරන බව ස්වරක්ෂණය (එම්බා ම් ) කරන ආයතනයට දැන්විය යුතුය. එබැවින්, කිසිදු එම්බාම් කිරීම් ක්‍රියාවලියකින් තොරව, මරණයෙන් පැය අටක් (8) ඇතුළත සිරුරු පරිත්‍යා ග කිරීමට අපි ඔබව දිරිමත් කරන්නෙමු.

7. පහත සඳහන් තත්ත්වයන්/රෝග ඇති දේහයන් භාර ගැනීමේ අවසාන තීරණය අංශ ප්‍රධානී සතු වන බව කරුණාවෙන් සලකන්න.

7.1 පශ්චාත් මරණ පරීක්ෂණයට බඳුන් කළ දේහ.
7.2 සෙංගමාලය/එච්.අයි.වී. ඒඩ්ස් වැනි බෝවන රෝ ග වලින් පෙළුණු රෝගීන්ගේ දේහ.
7.3 ඇඳ වණ හෝ මෑත දී සිදු කළ ශල්‍යකර්ම නිසා ඇති වූ විවෘත තුවාල ඇති දේහ.
7.4 අධික සන්ධි විකෘතිතා හේතුවෙන් පැතලි පෘෂ්ඨයක තැබීමට නොහැකි දේහ.
7.5 බද්ධ කිරීම් /ඉන්ද්‍රියයන් දන් දී ඇති අයගේ දේහ ( අක්ෂිදාන සංගමයට ඇස් ප්‍රදානය කරනු ලැබූ දේහයන් භාරගැනීමට බාධාවක් නොමැත).
7.6 විශාල ශල්‍ය කර්මයකට බඳුන් වූ දේහ හෝ ශරීරකො ටස් කපා ඉවත් කළ දේහ.
7.7 ඇතැම් පිළිකා වර්ග වලින් පෙලුනු /මෑතකදී කීමො තෙරපි ප්‍රතිකාරකය ලබාගත් රෝ ගීන්ගේ දේහ.
7.8 අධික ස්ථුල හෝ කෘෂ දේහ.

8. භාර දීමට ගෙන ආ මෘත දේහය අධ්‍යයන සහ පර්යේ ෂණ කටයුතු සඳහා සුදුසු තත්වයක නැතිනම්, එය ප්‍රතික්ෂේ ප කිරීමේ අයිතිය වෛද්‍ය පීඨය සතුව ඇති අතර, එවැනි අවස්ථාවකදී දේහය වෛද්‍ය පීඨයෙන් වහාම ඉවත් කර ගැනීමේ වගකීම මෘත දේහයේ භාරකරුවන්ට පැවරේ.

9. මෘත දේහය ප්‍රවාහනය කිරිම සඳහා පහසුකම් පීඨය මගින් සපයා නොදෙන බව කරුණාවෙන් සලකන්න.

10. මෘත දේහය භාරදීමෙන් පසුව නැවත එයට බුහුමන් දැක්වීමට අවසර දීම, දිගු කාලීනව මෘත දේහ තබාගැනීමට කටයුතු කිරීම හෝ දේහ කොටස්/කොටසක් ආපසු ඔබගේ භාර කරුවන් හට ලබා දීම කළ නොහැකිය.

11. මෘත දේහය දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් පසු මෘත දේහය රැගෙන ආ පෙට්ටිය භාර කරුවන් විසින් දෙපාර්තමේන්තු පරිශ්‍රයෙන් රැගෙන යායුතුය. මේ සඳහා අවමංගල්‍ය කටයුතු කිරීමට භාරදී ඇති ආයතනය සමඟ හෝ ඔබ කැමති ආයතනයක් (වැඩිහිටි නිවාස/රෝහල්) සමඟ අවශ්‍ය ඉදිරි කටයුතු සලසා ගැනිම ඔබගේ භාරකරුවන්ට පැවරේ.

12. අධ්‍යාපනික කටයුතු සඳහා මෘත ශරීර සහ එහි කො ටස් විශේෂ ආකාරයෙන් සකසා සෞඛ්‍ය/ වෛද්‍ය අධ්‍යාපන කටයුතු සඳහා පාසල් සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතන වලට ලබා දෙන අවස්ථාලදී ඒ සඳහා වැය වන මුදල අදාළ ආයතන/පාර්ශවයන්ගෙන් අය කර ගනු ලැබේ. ඒ පිළිබඳව ඔබගේ විරුද්ධත්වයක් නැතැයි අපි අපේක්ෂා කරමු.

13. ඔබගේ මෙම සත් ක්‍රියාව සමාජ මෙහවරකි. ඔබගේ පරාර්ථකාමී පරිත්‍යාගය වෛද්‍ය අධ්‍යාපනයට සහ වෛද්‍ය පර්යේෂණ සඳහා ඉමහත් වටිනාකමක් වනු ඇත. මේ සඳහා ඔබ හෝ ඔබේ පවුලේ සාමාජිකයින් කිසිදු ගෙවීමක් වෛද්‍ය පීඨයට හෝ වෛද්‍ය පීඨ කාර්යය මණ්ඩලයට සිදුනොකළ යුතුය.

14. අපගේ ත්‍යාගශීලි පරිත්‍යාගශීලීන් වෙත අපගේ කෘතවේදීත්වය සහ ගෞරවය පුද කිරීම සඳහා ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සහ පීඨය වාර්ෂිකව ආගමික පිංකමක් සංවිධානය කරන අතර, මේ සඳහා දායක වූ සියලුම පරිත්‍යාගශීලීන්ගේ පවුලේ සාමාජිකයින්ට ගෞරවයෙන් ආරාධනා කරනු ලැබේ.

ස්තුතියි.

මෙයට විශ්වාසී

**මූලාසන සහ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වජිර එච්.ඩබ්. දිසානායක**
කායවාවච්ඡේ ද, ප්‍රවේණි විද්‍යා සහ
ජෛව වෛද්‍ය තොරතුරු අධ්‍යයනාංශය
වෛද්‍ය පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය